# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1899/15 - 2015 ජනවාරි මස 28 වැනි බදාදා - 2015.01.28

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

### ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*යොමු අංකය* : එල්ඩී/05/2005/ඊ/615.

බ/සොරගුණේ මහා විද්‍යාලය සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

***ලබා ගැනීමට බලාපොරොත්තුවන ඉඩම්වල විස්තර*** :

ඌව පළාතේ, බදුල්ල දිස්ත්‍රික්කයේ, හල්දුම්මුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කන්දපල්ල කෝරළේ සුළු කොට්ඨාසයේ, මැදවෙල - 157 (එෆ්) ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, මහවෙල ගමේ සිහිටි, මැනුම් අධිකාරි විසින් පිළියෙල කරන ලද 2008.12.31 දින දරන අවසාන හුලක්ෂණාත්මක පිඹුර 45 හි අතිරේක අංක 5 හි පත්‍ර 4 හි පෙන්නුම් කර ඇති ප්‍රමාණයෙන් හෙක්. 0.2802 ක් පමණ වූ නම්වලින් හා ප්‍රමාණයන්ගෙන් යුත් ඉඩම් කැබැල්ල:

01. **කැබලි අංක 27**

ඉඩමේ නම: අඹගහවත්ත කුඹුර; විස්තරය : විවෘත මුඩු බිම; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් කියන අය ; සොරගුණේ කුඩා කතරගම දේවාලය, හල්දුම්මුල්ල; ප්‍රමාණය: හෙක්. 0.2802.

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2015 මාර්තු මස 02 වැනි දින පෙ.ව. 10.00ට හල්දුම්මුල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුයි.

තව ද, 2015 පෙබරවාරි මස 23 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම ලබා ගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුයි.

ඊ. එම්. එස්. බී. ජයසුන්දර,
ප්‍රාදේශීය ලේකම් (*වැබ*),
හල්දුම්මුල්ල.

2015 ජනවාරි මස 26 වැනි දින,
හල්දුම්මුල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

02-351

1A - G 20946 – 08 - (2015/01)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.